## වයඹ පළාතේ පළාත් සභාවේ 1990 අංක 10 දරණ
## වයඹ පළාතේ ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය

(වයඹ ආණ්ඩුකාරවරයා අනුමතිය දුන් දිනය :- 1990.12.12

වයඹ පළාත තුළ ව්‍යාපාර නාම යටතේ ව්‍යාපාර කටයුතු කරගෙන යන ව්‍යාපාරික ආයතන හා තැනැත්තන් ලියා පදිංචි කිරීමට විධි විධාන යෙදීම පිණිසත් එසේ ලියා පදිංචි කිරීම සඳහා ගාස්තු අය කිරීම පිණිසත් ඒ හා සම්බන්ධ වූ වෙනත් කටයුතු පිණිසත් පනවන ලද ප්‍රඥප්තියකි. මේ ප්‍රඥප්තිය (ව්‍යවස්ථාදායක නීති පැනවීම් වල 149 වන අධිකාරිය - පාරිශෝධිත ව්‍යවස්ථාදායක නීති පැනවීම් වල 180 වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥා පනතට අනුකූල නොවේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික, සමාජවාදී ජනරජයේ, වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මේ ප්‍රඥප්තිය 1990 අංක 10 දරණ වයඹ පළාතේ ව්‍යාපාර නාම පිළිබඳ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, 1991.01.01 දින සිට එය ක්‍රියාත්මක වන්නේය.

ප්‍රඥප්තිය යටතේ පරිපාලනය.

2. (1) මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා (මෙහි මින්මතු "පළාත් රෙජිස්ට්‍රාර් යනුවෙන් සඳහන් කරනු ලබන) පළාත් රෙජිස්ට්‍රාර්වරයකු පත් කරනු ලැබිය යුතුය. මේ ප්‍රඥප්තිය යටතේ සාමාන්‍ය පරිපාලනය ඔහුට භාර වන අතර මේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම හෝ බලාත්මක කිරීම සඳහා අවශ්‍ය වන ව්‍යාපාර නාම පළාත් සහකාර රෙජිස්ට්‍රාර්වරුන් හා වෙනත් නිලධරයන් අවශ්‍ය සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකිය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ පළාත් රෙජිස්ට්‍රාර්වරයාගේ බලතල, කාර්යයන් හෝ කර්තව්‍යයන් යම් පළාත් සහකාර රෙජිස්ට්‍රාර් වරයකු විසින් හෝ පළාත් රෙජිස්ට්‍රාර්වරයාගේ අත්සන යටතේ ලිඛිතව බලය පැවරුණු ලැබූ වෙනත් යම් නිලධරයකු විසින් පාවිච්චි කරනු ලැබිය හැකිය. ඉටු කරනු ලැබිය හැකිය. සිදු කරනු ලැබිය හැකිය.

ව්‍යාපාර නාම ලියා පදිංචිය.

3. (1) මෙහි දෙවන උප වගන්තියට යටත්වද මෙම ප්‍රඥප්තිය යටතේ ප්‍රදානය කරන ලද සහතිකයක බලය යටතේද හැර මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක වන දිනයේදී හෝ ඉන් පසුව වයඹ පළාත තුළ ව්‍යාපාර නාමයක් යටතේ ව්‍යාපාරයක් පවත්වාගෙන නොයා යුතුය.

(2) (149 අධිකාරිය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥා පනත යටතේ වයඹ පළාත තුළ පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරයක් සඳහා දැනටමත් නිකුත් කරනු ලද්දා වූ සහතික පත්‍රයක් මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතික පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ ප්‍රඥප්තියේ දිනයේ සිට මාස 6 ක කාලයක් සඳහා පමණක් එම සහතික පත්‍රය වලංගු වන්නේය.

(3) ඉහත 3(2) උප වගන්තියේ සඳහන් ලියා පදිංචිකිරීමේ සහතික මෙම ප්‍රඥප්තියේ දින සිට එහි විධිවිධාන වලට අනුකූලව නියමිත ගාස්තු ගෙවා ව්‍යාපාරික ආයතන හා තැන්පත්තක් ලියා පදිංචි කරවාගෙන අදාළ ලියාපදිංචි කිරීමේ සහතිකපත් ලබා ගත යුතුය.

(4) වයඹ පළාතේ ව්‍යාපාරික ස්ථානයක් පිහිටා ඇත්තාවූද, මේ ප්‍රඥප්තිය යටතේ නිකුත් කරන ලද වලංගු සහතිකයක් නොමැතිව ව්‍යාපාරික නාමයක් යටතේ ව්‍යාපාරය කර ගෙන යන්නාවූද, යම් ව්‍යාපාරික ආයතනයක් හෝ තැනැත්තෙකු, මේ ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මගින් ඒකාබද්ධ කරන ලද (149 වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම ආඥා පනතින් විධිවිධාන සලස්වා ඇති දණ්ඩන වලට යටත් විය යුතුය.

ඒකාබද්ධ කිරීමේ වගන්තිය.

4. (1) ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් පනවන ලද (149 වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥා පනතේ 2 සිට 16 දක්වා වූ (ඒ වගන්ති දෙකම ඇතුළුව) වගන්තිවල සහ 18 සිට 20 දක්වා වූ (ඒ වගන්ති දෙකම ඇතුළුව) වගන්තිවල විධිවිධාන එකී වගන්තිවල "ආඥා පනත" යන වචනය යෙදී ඇති කවර වුවද තැනක ඒ වෙනුවට "ප්‍රඥප්තිය" යන වචනය ආදේශ කිරීමට යටත්ව මේ ප්‍රඥප්තියෙන් ඒකාබද්ධ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒවා මේ ප්‍රඥප්තියෙන් කොටසක් වන්නේය. තවද, එකී වගන්ති අවශ්‍ය වෙනස් කිරීම් සහිතව වයඹ පළාත තුළ ව්‍යාපාර කටයුතු කරගෙන යන ව්‍යාපාරික ආයතන හා තැනැත්තන් ලියා පදිංචි කිරීම සඳහා අදාළ වන්නේය.

(2) මෙහි 1 වන තීරයෙහි දැක්වෙන යම් නිලධරයෙකුට, ස්ථානයකට, ආයතනයකට, ගාස්තුවකට හෝ වෙනත් දේකට අදාළව 4(1) වන උප වගන්තියේ සඳහන් විධිවිධාන වලට ඇතුළත් වන යම් සඳහනක් මෙහි 2වන තීරයේ තදානුරූපව දක්වා ඇති නිලධාරියෙකුට, ස්ථානයකට, ආයතනයකට, ගාස්තුවකට හෝ වෙනත් දෙයකට කරනු ලැබූ සඳහනක් සේ සලකනු ලැබිය යුතුය.

| 1 වන තීරය | 2 වන තීරය |
| --- | --- |
| අමාත්‍යවරයා | වයඹ පළාතේ මුදල් විෂයභාර පළාත් අමාත්‍යවරයා. |
| රෙජිස්ට්‍රාර් | පළාත් රෙජිස්ට්‍රාර්. |
| මේ ආඥා පනත | මේ ප්‍රඥප්තිය. |
| (ආඥා පනතේ 16(1) යටතේ) රුපියල් දෙකකට | රුපියල් විසි පහකට. |
| (ආඥා පනතේ 16(1) වගන්තියයටතේ) ශත පනහකට | රුපියල් දහයකට. |

(149 වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥා පනත වයඹ පළාත තුළ අදාළ නොවන බව.

5. (149 වන අධිකාරිය වූ) ව්‍යාපාර නාම පිළිබඳ ආඥා පනතේ විධිවිධාන අදාළ වන බවට මේ ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ විධි විධාන සලස්වා ඇත්තේ යැයි සලකනු ලබන තාක් දුරට හැර එකී ආඥා පනතේ විධි විධාන, ව්‍යාපාර නාම යටතේ වයඹ පළාත තුළ ව්‍යාපාර කරගෙන යන ව්‍යාපාරික ආයතන සහ තැනැත්තන් ලියා පදිංචි කිරීම සම්බන්ධයෙන් එය රට සම්බන්ධ කාර්යයන් සම්බන්ධයෙන් ක්‍රියාත්මක වීම නතර විය යුතුය.

6. (1) පහත දැක්වෙන කවර කරුණක් සඳහා වුවද ව්‍යවස්ථා හෝ නියෝග හෝ වයඹ පළාතේ මුදල් විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් සම්පාදනය කළ හැකිය.

(අ) පළාත් රෙජිස්ට්‍රාර්වරයෙකු හා පළාත් සහකාර රෙජිස්ට්‍රාර්වරුන් පත් කිරීම හා මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා ලියා පදිංචි කිරීමේ කාර්යාල පිහිටුවීම.

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ කිසියම් ප්‍රකාශයක් ලියා පදිංචි කිරීමේ ගාස්තුව රුපියල් හත්සිය පනහකට වැඩි නොවන පරිද්දෙන් පළාත් රෙජිස්ට්‍රාර්ට හෝ පළාත් සහකාර රෙජිස්ට්‍රාර්වරුන්ට ගෙවිය යුතු ගාස්තු.

(ඇ) මෙම ප්‍රඥප්තිය යටතේ පාවිච්චි කළ යුතු ආකෘතිපත්‍ර.

(ඈ) මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් රෙජිස්ට්‍රාර් හා පළාත් සහකාර රෙජිස්ට්‍රාර් විසින් ඉටු කළයුතු රාජකාරී.

(ඉ) මෙම ප්‍රඥප්තිය යටතේ පළාත් රෙජිස්ට්‍රාර් විසින් කළයුතු බවට නියම වූ කාර්ය භාරය පළාත් සහකාර රෙජිස්ට්‍රාර්වරුන් හා සෙසු නිලධාරීන් විසින් ඉටු කිරීම.

(ඊ) මෙම ප්‍රඥප්තිය යටතේ තබනු ලබන ලේඛන හෝ ඒවායේ අන්තර්ගත විස්තර පිළිබඳ වාර්තාවන්හි විස්තර ගැසට් පත්‍රයෙන් හෝ වෙනත් ක්‍රමයකින් කලින් කල ප්‍රසිද්ධියට පත් කිරීම, හා

(උ) මෙම ප්‍රඥප්තිය යටතේ ලියා පදිංචි කිරීම පිළිබඳ සාමාන්‍ය ක්‍රියාපටිපාටිය, පාලනය හා ඊට ආනුෂංගික වූ සෙසු කරුණුද වේ.

(2) එබඳු කිසියම් ව්‍යවස්ථා හෝ නියෝග සම්බන්ධයෙන් ගෙවිය යුතු සියළුම ගාස්තු වයඹ පළාතේ මුදල් විෂය භාර පළාත් අමාත්‍යවරයා විසින් විධාන කරන පරිද්දෙන් ගෙවිය යුතුය.

රේණු/-